# සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී ආයතනය සම්බන්ධයෙන් ගනු ලබන නියාමන ක්‍රියාමාර්ග

දුර්වල මූල්‍ය තත්ත්වය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද නියාමන අවශ්‍යතා සමග අනුකූල වීමට අඛණ්ඩව අසමත් වීම යන කරුණු සලකා බලමින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී ආයතනය වෙත මුදල් ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීමක් එම පනතේ අංක 37(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය (මුදල් මණ්ඩලය) විසින් නිකුත් කරන ලදී.

තවද, මෙම නිවේදනය මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ලබාදුන් බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීමක් පමණක් බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවධාරණය කර සිටී. එබැවින් බලපත්‍රය අවලංගු නොකල යුත්තේ ඇයිද යන්නට හේතු දක්වමින් මුදල් ව්‍යාපාර පනතෙහි නියම කර ඇති කාල සීමාව තුල, මුදල් මණ්ඩලය වෙත ලිඛිතව විරෝධතා ඉදිරිපත් කිරීමේ අවස්ථාව ආයතනය සතුව පවතී. ඒ අනුව, සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී ආයතනය විසින් මුදල් මණ්ඩලය වෙත ඔවුන්ගේ විරෝධතා ඉදිරිපත් කර ඇති අතර එම විරෝධතා සලකා බලා මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීම ඉල්ලා අස්කරගත යුතුද නැතිනම් බලපත්‍රය අවලංගු කළ යුතු ද යන්න තීරණය කරනු ඇත. විරෝධතාවය සමග සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී ආයතනය විසින් ප්‍රාග්ධනය වැඩිකිරීමේ සැලැස්මක් ද ඉදිරිපත් කර ඇති අතර එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සලකා බලමින් පවතී.

මේ සම්බන්ධව වැඩිදුර තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ **011-2398806** සහ **011-2398774** යන දුරකථන අංක ඇමතීමෙන් හෝ **snbfi_querysinf@cbsl.lk** යන විද්‍යුත් තැපැල් ලිපිනය හරහා ලබා ගත හැකි බව දන්වා සිටිමු.

**අධ්‍යක්ෂ - බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා මහ බැංකුව, නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01